# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2013 අංක 22 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2013 මැයි මස 08 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2013 මැයි මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි**

# 2013 අංක 22 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 මැයි මස 08 වැනි දින]

එල්. ඩී.—ඕ. 6/2013.

## (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

**1.** මේ පනත 2013 අංක 22 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතුය.

(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 24 වන වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

> "(6) 23 වන වගන්තියේ (1), (2) හෝ (3) වන උපවගන්තිය යටතේ හෝ එහි (4) වන උපවගන්තිය යටතේ යම් කොට්ඨාසයක රෙජිස්ට්‍රාර්වරයකු හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු වෙත කරනු ලබන සෑම නිවේදනයක් සමඟම, පිළිවෙලින් රුපියල් දහයක හෝ රුපියල් තිහක නැතහොත් අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් යම් මුදලක් ගෙවීම ඔප්පු කිරීම සඳහා වූ අවස්ථාවෝචිත පරිදි, එම කොට්ඨාසයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ එම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලදුපතක් ද ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> "(4) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ දී ප්‍රකාශය කරනු ලබන අවස්ථාවක දී, එම ප්‍රකාශය කරනු ලබන පාර්ශ්වය විසින් රුපියල් සියයක් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන යම් මුදලක් ගෙවනු ලැබිය යුතු අතර යම්

2—PL 007045—3,340 (2013/03)

කොට්ඨාසයක රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ දී ප්‍රකාශය කරනු ලබන අවස්ථාවක දී, එම ප්‍රකාශය සමග රුපියල් සියයක් හෝ නියම කරනු ලබන වෙනත් යම් මුදලක් ගෙවීම සඳහා වූ සාක්ෂියක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන ලදුපතක් ද ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(5) විවාහය සිදු කිරීමේ දින සිට දින හතක කාලයක් ඇතුළත දේවගැතිවරයා විසින් එම විවාහයේ අනු පිටපත විවාහ රෙජිස්ටරයෙන් ඉවත්කර, එම විවාහය ලියාපදිංචි කිරීම සඳහා, එම රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවිය යුතු බවට අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි, මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවක් ද සමඟ විවාහය සිදු කළ දිස්ත්‍රික්කය ඇතුළත සිටින එම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත එකී අනුපිටපත යවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) ඉහතින්ම වූ උප වගන්තියේ විස්තර කර ඇති පන්තියකට හැර, ස්ත්‍රී පාර්ශ්වය යම් පන්තියකට අයත්වන අවස්ථාවක දී, හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව එම උපවගන්තියේ ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලබන අවස්ථාවක දී, විවාහ වීමට අදහස් කර සිටින එක් පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් කිරීමෙන් පසුව සහ රුපියල් තුන්දහස් පන්සියයක මුදලක් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි යම් මුදලක් ගෙවීමෙන් පසු ඒ පිළිබඳ සාධකයක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන ලදුපතක් ද සමග මෙම බලපත්‍රයේ නම් සඳහන් ස්ථානයේදී සහ පාර්ශ්වයන් විසින් කැමැත්ත දක්වනු ලබන වේලාවක දී විවාහය සිදු කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයකු වෙත, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් බලය ලබාදෙන අවසර පත්‍රයක් නිකුත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) සෑම ලිඛිත ඉල්ලීමක්ම සහ එහි සෑම සහතික පිටපතක් හෝ සහතික කරන ලද උද්ධෘතයක් ලබා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන යම් මුදලක් ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු" යන වචන වෙනුවට, "අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** 2006 අංක 36 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියට දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"දෙවන උපලේඛනය (62 වන වගන්තිය)

| | කුමන කාර්ය සඳහා ද යන වග | ගෙවිය යුත්තේ කාටද යන වග | ගෙවනු ලබන්නේ කවුරුන් විසින් ද යන වග | මුදල රු. ශත |
|---|---|---|---|---|
| 1 | ඔහුගේ කාර්යාලයේ දී හෝ වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුළත් කිරීම. | රෙජිස්ට්‍රාර්වරයාට | අයදුම්කරු | 100.00 |
| 2 | ඔහුගේ කාර්යාලයේ දී හෝ වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුළත් කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | අයදුම්කරු | 100.00 |
| 3 | විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම. | රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 100.00 |

| | | | | |
|---|---|---|---|---|
| 4 | විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 100.00 |
| 5 | ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම. | රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 750.00 |
| 6 | ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථානයක දී සිදු කරන ලද විවාහයක් ලියාපදිංචි කිරීම. | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 750.00 |
| 7 | ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 750.00 |
| 8 | 38 වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහයක් සිදු කිරීම. | රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 1500.00 |
| 9 | 38 වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහයක් සිදු කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 1500.00". |

වලංගුවීම.

**9.** 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන්නා වූ දිනයෙන් අවසන් වන කාලය දක්වා යම් ගාස්තුවක් අය කිරීම සඳහා හෝ එකතු කිරීම සඳහා මේ පනත මගින් බලය දී ඇති යම් කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ බලය පවරන ලද යම් තැනැත්තකු විසින් අය කරනු ලබන හෝ එකතු කරනු ලබන යම් ගාස්තු රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා විසින් හෝ මේ පනත යටතේ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් වලංගු ලෙස අය කරනු ලැබ හෝ එකතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඉහත කී විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ දී අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් කරනු ලබන තීරණයකට හෝ නියමයකට නැතිනම් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නඩු කටයුතු සඳහා බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

10. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්,එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.